රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා
சுதந்திர சதுக்கம் கொழும்பு 07 இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | MPubAd/ AcSD/Spl. Grade /2023 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2024.03.15 |

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u>**
**<u>(2023.07.01 දිනට සහ 2024.01.01 දිනට පවතින පුරප්පාඩු සඳහා)</u>**

අංක 1670/33 දරණ 2010.09.10 වන දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අංක 2323/29 දරණ 2023.03.16 වන දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරන ලද 08 වන ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධාන අනුව 2023.07.01 දිනට සහ 2024.01.01 දිනට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාවේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලැබූ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත.

02. ඒ අනුව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ 2023.07.01 දිනට සහ 2024.01.01 දිනයන්ට පහත පරිදි පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා එම කාලසීමාව තුළ සේවයේ නියුතුව සිටි සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා සුදුසුකම්ලත් නිලධාරීන් අතරින් ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ අනුපිළිවෙළ අනුව මුළු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන නිලධාරීන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට කටයුතු කරනු ලැබේ.

| දිනය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| 2023.07.01 | 04 |
| 2024.01.01 | 11 |

03. **විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්**

I. සේවා ව්‍යවස්ථාවේ V වන පරිශිෂ්ඨයේ සඳහන් කවර හෝ සුදුසුකමක් සපුරා තිබීම(ඇමුණුම I).
II. උසස් කිරීමේ දිනට සේවයේ පළමු ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබීම.
III. උසස් කිරීමේ දිනට සේවයේ වසර දහඅට (18) කට නොඅඩු සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්යසාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.
V. උසස් කිරීමේ දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති වීම.
VI. තුන්වන කාර්යක්ෂමතා කඩයිම නියමිත දිනට සම්පූර්ණ කර තිබීම හෝ නිදහස් කර තිබීම.

දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: info@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.pubad.gov.lk

04. **උසස් කිරීමේ ක්‍රමය**

4.1 සේවා ව්‍යවස්ථාව සඳහා අංක 2323/29 හා 2023.03.16 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් සිදු කරන ලද 8 වන සංශෝධනයේ 10.3.2 ඡේදයට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත ජ්‍යෙෂ්ඨතාවය මත පදනම්ව උසස්වීම් සිදුකරන අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් යටතේ 2023.07.01 සහ 2024.01.01 දිනට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවේ එකතුව මෙන් දෙගුණයකට නොවැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ජ්‍යෙෂ්ඨතාවය මත විශේෂ ශ්‍රේණියට උසස්කිරීම සඳහා වන නිර්දේශයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

4.2 2023.07.01 දිනට පවත්නා පුරප්පාඩු සඳහා උසස් කරනු ලබන නිලධාරීන් විශ්‍රාම ගැනීම නිසා 2024.01.01 දිනට නැවත ඇතිවන පුරප්පාඩු ද සමඟ 2024.01.01 දිනට මුළු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ඉහත 4.1 පරිදි කටයුතු කරනු ලැබේ.

4.3 ඒ අනුව 2023.07.01 දිනට සහ 2024.01.01 දිනට යන එක් එක් දිනයන්ට විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන නිලධාරීන් සංඛ්‍යාවක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

4.4 විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් විශේෂ ශ්‍රේණිය යටතේ අනුමත කර ඇති තනතුරකට පත්කරනු ලැබීමෙන් අනතුරුව එම පත්වීම ලද දින සිට ලිත් මසක කාලයක් ඇතුළත නව තනතුරේ රාජකාරි භාර ගැනීමට කටයුතු කළ යුතු අතර, එලෙස රාජකාරි සඳහා ලිත් මසක් තුළ වාර්තා නොකරනු ලබන නිලධාරීන් වෙත පිරිනමන ලද විශේෂ ශ්‍රේණියේ උසස්වීම, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2021 හි විධිවිධාන ප්‍රකාරව අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.

05. 2023.07.01 දිනට සහ 2024.01.01 දිනට පවත්නා පුරප්පාඩු සඳහා උසස්වීම් කරනු ලබන බැවින් එම එක් එක් දිනට සුදුසුකම් ලබන නිලධාරීන් තමා විසින් මේ සමඟ වන ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන් මඟින් මා වෙත 2024.04.01 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. එදිනට පසුව එවන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලබන අතර සදොස්ව හා අසම්පූර්ණව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇත්නම් පමණක්, අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන මෙන් දන්වා සිටින අතර, දැනට විශ්‍රාම ගෙන සිටියේ වුවද, ඉහත පුරප්පාඩු දිනයන්ට සේවයේ නිරතව සිටි සහ උසස්වීමට ඉහත 03 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති පෙර උසස්වීම් අවස්ථාවේදී සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි නමුත් උසස්වීම් නොලද හෝ ඉල්ලුම් කිරීමට නොහැකි වූ නිලධාරීන්ට ද මෙම උසස්වීම් සඳහා ඉල්ලුම් කළ හැකිය.

07. 2023.07.01 දිනට සහ 2024.01.01 දිනට සේවයේ යෙදී සිට එදිනට පසු විශ්‍රාම ගෙන ඇති හෝ දැනට සේවයේ යෙදී සිටින ඉහත 03 ඡේදයේ සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට පමණක් අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන මෙන් මෙමඟින් දන්වා සිටිමි.

08. මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

**ප්‍රදීප් යසරත්න**
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය


දුරකතන : 0112696211-13 (දිගුව -132/218) / 0112698672
ෆැක්ස් : 0112-693304
විද්‍යුත් ලිපිනය : d.acsd.pubad@gmail.com

(ඇමුණුම I)

## <u>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවේ V වැනි පරිශිෂ්ටය</u>

පහත දැක්වෙන සුදුසුකම්වලින් කවර හෝ සුදුසුකමක් ලබා තිබීම.

I. අදළ වෘත්තීය පාඨමාලාවක් හදාරා ඇති එක්සත් රාජධානියේ වරලත් රාජ්‍ය මූල්‍ය හා ගිණුම් ආයතනයේ සමාජිකත්වය හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ **වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සාමාජිකත්වය;**

හෝ

II. **රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍ය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය** වැනි අදාළ ක්ෂ්ත්‍රයන් පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයක් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ ආයතනයක් වෙතින් පශ්චාත් උපාධියක් ලබා තිබීම;

හෝ

III. ඉහත (II) වැනි අනු ඡේදයෙහි සඳහන් ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහිතව යම් විෂය ක්ෂේත්‍රයක් පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයක් වෙතින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ විශ්ව විද්‍යාලයකින් ශාස්ත්‍රපති මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

හෝ

IV. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ඉහත II ඡේදයේ දැක්වෙන විෂය ක්ෂේත්‍රයන්ගෙන් එකක් පිළිදව පිරිනමන පශ්චාත් උපාධියක් ;

හෝ

V. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ඉහත II ඡේදයේ දැක්වෙන විෂය ක්ෂේත්‍රයන්ගෙන් එකක් පිළිබඳ පිරිනමන පශ්චාත් උපාධිය ඩිප්ලෝමාවක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ විශ්ව විද්‍යාලකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයෙහි I ශ්‍රේණියේ නිලධාරීන්**
**විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන අයදුම්පත**

කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි

| අයදුම්පත් අංකය | F |
|---|---|

**(අ) කොටස - නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

1. නම :……………………………………………………………………………….
   1.1 සම්පූර්ණ නම :…………………….…………………………………...මෙය/මිය/මයා
   1.2 පත්වීම් ලිපියෙහි සඳහන් නම:........…………………..........................................
2. ජාතික හැඳුනුම්පත් අංකය :………………………………………………………
   (ජාතික හැඳුනුම්පතේ සහතික කළ ඡායා පිටපතක් අංක 02 වශයෙන් අංක කර ඇමිණිය යුතුය)
3. උපන් දිනය :………………………………………………………
4. පෞද්ගලික ලිපිනය :………………………………………………………
5. දුරකථන අංකය - 5.1 නිවස :……….......................5.2 ජංගම:………….........................
   5.3 විද්‍යුත් තැපැල :………….……………………………………………………
6. 6.1 තනතුර :………………………………………………………

   (දැනට දරන / දැනට විශ්‍රාමික නම් විශ්‍රාම යන අවස්ථාවේදී දැරූ )…………………………….

   6.2 දැනට විශ්‍රාමික නම් විශ්‍රාම ගත් දිනය :…………………………………………
7. අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :…………………………………………
8. කාර්යාලීය ලිපිනය :…………………………………………………………
9. 9.1 කාර්යාලීය දුරකථන අංකය :…………………………………………………
   9.2 කාර්යාලීය ෆැක්ස් අංකය :…………………………………………………
10. පත්වීම් / උසස්වීම් දින :…………………………………………………………
    10.1 ශ්‍රී ලං.ග.සේ. III ශ්‍රේණියට පත් වීම් දිනය:…………………………………………
    10.2 ශ්‍රී ලං.ග.සේ. II ශ්‍රේණියට උසස් වූ දිනය :…………………………………………
    10.3 ශ්‍රී ලං.ග.සේ. I ශ්‍රේණියට උසස් වූ දිනය :…………………………………………

    (සේවය ස්ථිර කළ ලිපිය, II හා I ශ්‍රේණියට උසස්වීම් ලිපිවල සහතික කළ පිටපත් 10.1,2 හා 3 වශයෙන් අංක කර ඇමිණිය යුතුය.)

11. I ශ්‍රේණියට උසස්වීමෙන් පසු සේවයේ නොසිටි කාල සීමාවන් සහ විනයානුකූල දඬුවම් ලැබීම මත සේවා කාලය අඩුවීම්

11.1 නිවාඩු ලබා ගැනීම මත සේවා කාලය අඩුවීම් (අදාළ වේ නම් පමණක් සම්පූර්ණ කරන්න)

| අනු අංකය | නිවාඩු අනුමැතිය සඳහා අදාළ කොන්දේසි | කාල සීමාව | | සේවා කාලය අඩුවන දින ගණන | | |
|---|---|---|---|---|---|---|
| | | සිට | දක්වා | අවු: | මාස | දින |
| I. | ආයතන සංග්‍රහයේ V:2.5.4 | | | | | |
| II. | ආයතන සංග්‍රහයේ XII: 16 | | | | | |
| III. | ආයතන සංග්‍රහයේ XII: 36 | | | | | |
| IV. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 10 | | | | | |
| V. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 | | | | | |
| VI. | වෙනත් වැටුප් රහිත නිවාඩු | | | | | |
| සේවා කාලය අඩුවන සම්පූර්ණ දින ගණන | | | | | | |

(නිවාඩු අනුමත කළ ලිපිවල සහතික කළ පිටපත් 11.1.I, 11.1.II, 11.1.III ආදී වශයෙන් කරුණට අදාළව අංක කර ඇමිණිය යුතුය.)

11.2 විනය කරුණු මත සේවා කාලය අඩුවීම (අදාළ වේ නම් පමණක් සම්පූර්ණ කරන්න)

| විනය තීරණය | චෝදනා පත්‍රය අනුව වරද සිදු වූ කාල සීමාව | සේවා කාලය අඩුවන දින ගණන | | |
|---|---|---|---|---|
| | | අවු. | මාස | දින |
| I. වැටුප් වර්ධක ................ක් විලම්භනය කිරීම | | | | |
| II. වෙනත් | | | | |
| සේවා කාලය අඩුවන සම්පූර්ණ දින ගණන | | | | |

(විනය තීරණ වල සහතික කළ පිටපත් 11.2.I, 11.2.II ආදී වශයෙන් කරුණට අදාළව අංක කර අමුණා තිබිය යුතුය.)

11.3 ඉහත 11.1 හා 11.2 හි මුළු එකතුව :අවු ................මාස ....................දින ........................

11.4 I ශ්‍රේණියට පත්වූ දිනෙන් ඉදිරියට ඉහත 11.3හි කාලසීමාව ඉවත් කළ විට දිනය :…........………..

12. පූර්වාසන්න වර්ෂයන්හි වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

12.1 උසස්වීමට සුදුසුකම් ලබන දිනට 2018 සිට 2023 දක්වා සියලු වැටුප් වර්ධක** උපයාගෙන ඇත/නැත. *
(ආයතන සංග්‍රහයේ XII:16:9, XII:16:10 සහ XII:36:1:4 (i) හා (ii) යටතේ ලබා ඇති වැටුප් වර්ධක උසස් වීම් සඳහා පිළිගනු නොලැබේ.)

*(අදාළ නොවන වචනය කපා හරින්න)

12.2 උසස්වීමට සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක ලබා නොමැති නම් වැටුප් වර්ධක 05 ලබන දින තෙක් උසස් වීමට සුදුසුකම් ලබන දිනය නැවත ගණනය කළ යුතුය. ඒ අනුව සුදුසුකම් ලබන දිනය** : ……….....……..

** (වැටුප් වර්ධක පත්‍රිකාවල සහතික කළ පිටපත් 12.1 සිට 12.6 දක්වා අංක කර අමුණන්න)

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුව විනයානුකූල දඬුවම් ලබා නොමැති වීම.

13.1 ගොනුව අනුව, උසස් වීමට සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර 05 තුළ කිසිදු විනය දඬුවමකට ලක් වී නොමැත. (දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මේ බව ලිඛිත ප්‍රකාශයකින් සහතික කළ යුතුය - ඉල්ලුම්පතෙහි "ආ" කොටස යටතේ)

13.2 13.1 හි සඳහන් කාලසීමාව තුළ විනය දඬුවමකට ලක්ව ඇති අතර 11.2 යටතේ කරුණු සඳහන් කර ඇත්නම් සහ ඒ අනුව උසස්වීම් දිනය සංශෝධනය වේ නම් එම දිනය : …………….

13.3 උසස් වීමට සුදුසුකම් ලබන දිනය 12.2 හා 13.2 අනුව සංශෝධනය වේ නම් නව සංශෝධිත දිනය : ……………………

14. පූර්වාසන්න වර්ෂයන්හි වාර්ෂික කාර්ය සාධන ඇගයුම අනුව වැඩ හැසිරීම යහපත් බව පිළිබිඹු වීම.

ඉහත 12 හෝ 13 අනුව සුදුසුකම් ලබන දිනට අදාළ වර්ෂයට පූර්වාසන්න වර්ෂයන්හි කාර්ය සාධන ඇගයුම පහත වගුවෙහි සටහන් කළ යුතුය. එම වගුවෙහි සඳහන් පරිදි සියළු වර්ෂයන්හි කාර්ය සාධන වාර්තාවන්හි සහතික කළ පිටපත් ඇමිණිය යුතුය. කාර්ය සාධන වාර්තාවේ අවසාන ඇගයුමෙහි විකල්ප නිර්දේශ එකකට වඩා දක්වා ඇති සහ අදාළ නිලධාරීන්ගේ අත්සන් හා නිල මුද්‍රා තබා නොමැති වාර්තා පිළිගනු නොලැබේ.

| **වර්ෂය** | **අවසාන ඇගයුම<br>විශිෂ්ඨයි/ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි/ සතුටුදායකයි/ අසතුටුදායකයි** | **අදාළ නිලධාරීන් අත්සන් තබා ඇත/නැත** |
|---|---|---|
| 2018 | | |
| 2019 | | |
| 2020 | | |
| 2021 | | |
| 2022 | | |
| 2023 | | |

එක් එක් වර්ෂයේ කාර්ය සාධන වාර්තාව අනුව සෑම පේළියක් හා තීරුවක්ම සම්පූර්ණ කළ යුතුය.

15. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවේ 10.3.1.හා (v) පරිශිෂ්ඨය අනුව සුදුසුකම් පිළිබඳ තොරතුරු:

| 15.1 අනු අංකය | 15.2 පශ්චාත් උපාධිය/ වෙනත් | 15.3 විෂය ක්ෂේත්‍රය | 15.4 එම උපාධිය/ සුදුසුකම පිරිනමන ලද විශ්වවිද්‍යාලය/ ආයතනය | 15.5 එම විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාලයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගෙන තිබේද යන වග | 15.6 උපාධි/ පාඨමාලා කාල සීමාව (ආරම්භක හා අවසාන දිනය) | 15.7 උපාධිය/ පාඨමාලාව වලංගු දිනය |
|---|---|---|---|---|---|---|
| 01 | | | | | | |
| 02 | | | | | | |
| 03 | | | | | | |
| 04 | | | | | | |
| 05 | | | | | | |

(15.1 වශයෙන් පශ්චාත් උපාධි සහතිකයේ/පාඨමාලාවේ හා විස්තරාත්මක උපාධි සහතිකයේ/ පාඨමාලාවේ ඡායා පිටපත් සහතික කර ඇමිණිය යුතුය)

16. උසස් වීමට සුදුසුකම් ලබන දිනට සේවයේ වසර දහඅට (18) කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇත./නැත.*

17. තුන්වන (03) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

17.1 සම්පූර්ණ කළ යුතු දිනය : …………………......

17.2 සම්පූර්ණ කළ දිනය : …………………......

(17. වශයෙන් අංක යොදා අදාළ සහතික පත්‍රයේ සහතික කරන ලද පිටපතක් ඇමිණිය යුතුය)

ඉහත අංක 01 සිට 17 තෙක් නිරවද්‍ය හා සම්පූර්ණ තොරතුරු සහිත ඉල්ලුම්පත්‍ර සහ අමුණා එවන ලෙස සඳහන් කර ඇති සියලු ලේඛන වල සහතික කළ පිටපත් කරුණට අදාළ අංකය එක් එක් ලේඛනයේ දකුණු ඉහළ කෙළවරෙහි සටහන් කර අංක පිළිවෙලින් අමුණා ගොනුවක් වශයෙන් සකස් කර, මේ සමඟ ඉදිරිපත් කරමි.

තවද මා විසින් උසස් කිරීම මත පත් කරනු ලැබීමට ඉල්ලා ඇති ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරක් පුරප්පාඩුව පවතින ඕනෑම සේවා ස්ථානයක/එම ස්ථානවලට ඉතා ආසන්න සේවා ස්ථානයක ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරක් සඳහා පත්කරනු ලැබීමට කැමැත්ත ප්‍රකාශ කරමි.

ලිත් මසක් ඇතුළත එම තනතුර භාරගැනීමට අපොහොසත් වුවහොත් උසස් කිරීමට පෙර සිටි ශ්‍රේණියට සහ තනතුරට පෙරලා යවනු ලැබීමට මෙයින් කැමැත්ත ප්‍රකාශ කරමි.

දිනය: .................................... ……………………………..

ඉල්ලුම්කරුගේ අත්සන

හා තනතුරු නාමය

**(ආ) කොටස - දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

ලේකම්,

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය / අදාළ අමාත්‍යාංශය

1. නිලධාරියා/නිලධාරිනිය ඉහත සඳහන් කර ඇති සියළු කරුණු නිවැරදිය.
2. අංක 11,12 හා 13ට අදාළ කරුණු ගොනුව අනුව සසඳා බලන ලදි. සදහන් කර ඇති කරුණු නිවැරදි බවද සියළු තොරතුරු සම්පූර්ණව ඉදිරිපත් කර ඇති බවද අදාළ සියළු ලේඛනවල **සහතික කළ** පිටපත් අමුණා ඉදිරිපත් කර ඇති බවද සහතික කරමි.
3. නිලධාරියාට/නිලධාරිනියට එරෙහිව විනය කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් හෝ **විනය පරීක්ෂණ සිදු වෙමින් පවතියි/නොපවතියි.***

   3.1 ඉහත පිළිතුරු "පවතියි" නම් වරද කළ දිනය : ......................................................................

   3.2 විනය බලධාරියා විසින් නිකුත් කළ චෝදනා පත්‍රයේ අංකය හා දිනය : ................................

4. ......................................................................................... මහතා / මහත්මිය / මෙනවිය ගේ රාජකාරි / පැමිණීම / හැසිරීම සතුටුදායකය. ඔහුගේ/ ඇයගේ කාර්ය සාධනය, නායකත්වය, හැකියාව හා ඊළඟ උසස් වීමට අදාළව තනතුරු හා වගකීම් දැරීමේ හැකියාව සලකා බැලීමි. ඔහු / ඇය ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි /නිර්දේශ නොකරමි*

5. නිවැරදිව, අනූනව සම්පූර්ණ කල අයදුම්පතද, එක් එක් කරුණට අදාළ අංකය සටහන් කරමින් අංක පිළිවෙලින් අදාළ ලේඛන වල සහතික කළ පිටපත් ද අමුණා සකස් කරන ලද ගොනුව මේ සමඟ එවමි.

දිනය : ....................................... ....................................

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ

අත්සන, තනතුරු නාමය

සහ නිල මුද්‍රාව

සටහන : නොගැළපෙන වචන කපා හරින්න

**(ඇ) කොටස - අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්/පළාත් ප්‍රධාන ලේකම් විසින් සම්පූර්ණ කළ යුතුය.**

ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

1. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ..................................................... මහතා / මහත්මිය / මෙනවියගේ රාජකාරි හා හැසිරීම පිළිබඳව දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සමඟ එකඟ වෙමි. / එකඟ නොවෙමි.*

2. නිලධාරියාගේ රාජකාරි / හැසිරීම / විශේෂ කුසලතා හා කාර්ය සාධනය ඇගයීමට ලක් කෙළමි. ........................................................................... මහතා / මහත්මිය / මෙනවිය ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම **නිර්දේශ කරමි. / නොකරමි**.*
(* නිර්දේශ නොකරන්නේනම්, හේතුව කෙටියෙන් සඳහන් කරන්න.)
.........................................................................................................................................
.........................................................................................................................................

3. නිවැරදිව, අනූනව සම්පූර්ණ කල අයදුම්පතද, එක් එක් කරුණට අදාළ අංකය සටහන් කරමින් අංක පිළිවෙලින් අදාළ ලේඛන වල සහතික කළ පිටපත් ද අමුණා සකස් කරන ලද ගොනුව මේ සමඟ එවමි.

| | |
|---|---|
| .......................... | ........................................ |
| දිනය | අමාත්‍යාංශ ලේකම්ගේ / පළාත් ප්‍රධාන ලේකම්ගේ අත්සන |
| | නිල මුද්‍රාව : |

සටහන - නොගැලෙපන වචන කපා හරින්න.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு

**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා

சுதந்திர சதுக்கம் கொழும்பு 07 இலங்கை.

Independence Square, Colombo 07, Sri Lanka.

මගේ අංකය / எனது இல / My No: MPubAd/ AcSD/Spl. Grade /2023

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2024.03.15

Secretaries of Ministries
Chief Secretaries of Provinces
Secretaries of Commissions
Heads of Departments

**Promotion of Officers in Grade I of the Sri Lanka Accountants' Service to Special Grade (For vacancies that exist as at 01.07.2023 and 01.01.2024)**

Approval of the Public Service Commission has been granted to call applications from the qualified officers to fill the vacancies existing in the cadre of Special Grade of Sri Lanka Accountants' Service as at 01.07.2023 and 01.01.2024 in terms of the 08th revision made to the minute of the Sri Lanka Accountants' Service published by Gazette Extraordinary No. 1670/33 dated 10.09.2010 by Gazette Extraordinary No.2323/29 dated 16.03.2023.

02. Accordingly, action will be taken to call officers equivalent to two folds of the total number of the vacancies on the order of the seniority out of the qualified officers for the interview by calling applications from the officers who have satisfied prescribed qualifications and serving in the service during the said period in order to fill the vacancies existed in the Special Grade of the Sri Lanka Accountants' Service as at 01.07.2023 and 01.01.2024 in the following manner.

| Date | Number of vacancies |
|---|---|
| 2023.07.01 | 04 |
| 2024.01.01 | 11 |

03. **Qualifications to be satisfied to be promoted to Special Grade**

I. Should have satisfied any qualification mentioned in Appendix V of the Service Minute. (Annex I)

II. Should have completed an active and satisfactory service period of five (05) years in Grade I of the service as at the date of promotion and earned five (05) salary increments after being promoted to Grade I.

III. Should have completed an active period of service of not less than eighteen (18) years as at the date of promotion.

IV. Should have achieved an annual performance at satisfactory level or above during the 05 years immediately preceding the date of promotion.

V. Should have not been subjected to a disciplinary punishment as per the provisions stipulated in Public Service Commission Circular No. No. 01/2020 as at the date of promotion.

VI. Should have completed the 3rd Efficiency Bar Examination as at the due date or should have been exempted from the same.

දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: info@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.pubad.gov.lk

04. **Method of Promotion:**

4.1 Promotions are made on the seniority obtaining the approval of the Public Service Commission as per paragraph 10.3.2 of the 08th revision made to the service minute by Gazette Extraordinary No. 2323/29 dated 16.03.2023 and a number of candidates not more than the two folds of the total number of vacancies existed as at 01.07.2023 and 01.01.2024 will be interviewed by a board of interview approved by the Public Service Commission and then the recommendations for promotions to the Special Grade on seniority will be submitted to the Public Service Commission.

4.2 Action will be taken as mentioned in 4.1 above to fill the total number of vacancies existed as at 01.01.2024 along with the vacancies which occur again on 01.01.2024 due to the retirement of officers who are promoted to the posts fallen vacant as at 01.07.2023.

4.3 Accordingly, the Public Service Commission will promote a number of officers equivalent to the vacancies existed as at 01.07.2023 and 01.01.2024.

4.4 The officers promoted to Special Grade should assume duties of their new post within one calendar month from the date of appointment to a post approved under Special Grade and action will be taken as per Public Service Commission Circular No. 01/2021 to cancel the promotion granted to the officers to Special Grade, who failed to report for duty within a period of one calendar month.

05. Since promotions are made based on the vacancies existed as at 01.07.2023 and 01.01.2024, the officers who become qualified on each date should send their applications perfected by themselves in accordance with the attached specimen to reach me on or before 01.04.2024 through the Secretaries of Ministries/ Chief Secretaries of Provinces. The applications submitted after this date will not be accepted under any condition and the applications which are incomplete and incorrect will be rejected.

06. It is hereby requested to inform the relevant officers to submit their applications only if they have satisfied the above-mentioned basic qualifications. Further, the officers who were in service on the above dates pertaining to the vacancies but not promoted even after appearing for the interview for promotion and who were unable to submit their applications can also apply for these promotions if they have satisfied the qualifications prescribed in paragraph 03 above.

07. Further, it is requested to inform that only the officers who were in the service as at 01.07.2023 and 01.01.2024 and then retired or still in service should submit their applications provided that they have satisfied the basic qualifications prescribed in paragraph 03 above.

08. Please make the relevant officers aware in this regard.

Sgd/ Pradeep Yasarathne
Secretary
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

Telephone: 0112696211-13 ( Extension -132 / 218 ) / 0112698672
Fax: 0112-693304
E- mail : d.acsd.pubad@gmail.com

Annex I

## Appendix V of the Minute of Sri Lanka Accountants' Service

Possession of any of the following qualifications:-

I. Membership of the Chartered Institute of Government Accounts and Finance of the United Kingdom or Membership of the Institute of Chartered Accountants of Sri Lanka or Chartered Institute of Management Accountants or Association of Chartered Certified Accountants**;**

or

II. Possession of a Post-Graduate degree in the subjects of Public Financial Management, Financial Management, Public Finance, Accountancy, Development Finance, Commerce, Economics, Business Management, Public Management, Information Technology, Government Policy, Project Management or related field from a recognized university or an institute approved by the University Grants Commission;

or

III. Possession of a Post Graduate Diploma in a field referred to in sub para (II) above with a post graduate degree in a Masters level from a recognized university or a university approved by the University Grants Commission;

or

IV. Possession of a Postgraduate degree awarded by the Sri Lanka Institute of Development Administration in any of the fields referred to in para II above;

or

V. Possession of a Postgraduate degree from a recognized university or from a university approved by the University Grants Commission with a Post Graduate Diploma awarded by the Sri Lanka Institute of Development Administration in any one of the fields referred to in Section II in above.

# Application for Promotion of Officers in Grade I of the Sri Lanka Accountants' Service to Special Grade

Application number | F |

(For Office Use Only.)

**Part (A) - To be filled by the officer.**

1. Name :
   1.1 Name in full : Miss/Mrs/Mr …………………………………………………
   1.2 Name indicated in the letter of appointment : Miss/Mrs/Mr …………………….
2. Number of the N.I.C. : ………………………..
   (A certified photocopy of the National Identity Card should be attached, numbering the same as No.02)
3. Date of Birth : …………………………………………………………..
4. Private Address : …………………………………………………………..
5. Telephone number - 5.1 Residence : …………………… 5.2 Mobile: ……………
   5.3 Email address :………………………….
6. 6.1 Post : ……………………………………….
   (Post held at present/ if retired at present, post held at the time of retirement)
   6.2 If retired at present, date of retirement : ……………………………………
7. Ministry/ Department: ……………………………………….
8. Office address : ……………………………………………………….
9. 9.1 Office telephone number: ………………………………………..
   9.2 Office fax number: ……………………………………………….
10. Dates of appointment / promotions :
    10.1 Date of appointment to Grade III of S.L.Ac.S. : ………………………
    10.2 Date of promotion to Grade II of S.L.Ac.S. : ………………………
    10.3 Date of promotion to Grade I of S.L.Ac.S. : ………………………

    (Certified copies of the letter of confirmation in service and letters of promotion to Grade II and I should be attached, as No.10.1, 10.2 and 10.3.)

11. Periods of absence from service and deductions from service period on disciplinary punishments after promotion to Grade I

11.1 Deduction of service period due to obtaining leave (Complete only if relevant)

| Serial number | Conditions applied in granting approval for leave | Duration | | Number of days by which the service is deducted | | |
|---|---|---|---|---|---|---|
| | | From | To | Years | Months | Days |
| I. | Establishments Code of V:2:5:4 | | | | | |
| II. | Establishments Code of XII:16 | | | | | |
| III. | Establishments Code of XII:36 | | | | | |
| IV. | Management Services Circular No.10 | | | | | |
| V. | Management Services Circular No.33 | | | | | |
| VI. | Other no pay leave | | | | | |
| Total number of days by which the service period is deducted | | | | | | |

(Certified copies of letters by which the leave has been approved should be attached, numbering them as 11.1.I, 11.1.II, 11.1. III etc., as applicable.)

11.2 Deduction of the service period on disciplinary grounds (Complete only if relevant)

| Disciplinary Decision | Duration in which the offence has been committed as per charge sheet | Number of days by which the service period is deducted | | |
|---|---|---|---|---|
| | | Years | Months | Days |
| I. Deferring …… salary increments | | | | |
| II. Other | | | | |
| Total number of days by which the service period is deducted | | | | |

(Certified copies of disciplinary decisions should be attached, numbering them as 11.2.I, 11.2.II, etc., as applicable.)

11.3 Total of 11.1 & 11.2 :Years .................. Months ................... Days .......................

11.4 Date after the deduction of the period indicated in 11.3 above from the date of appointment to Grade I: …………………….

12. Shall have earned the salary increments in the immediately preceding years.

12.1 Has/has not earned all the salary increments** as at the date of promotion from 2018 to 2023. *

(The salary increments earned under XII:16:9, XII:16:10 and XII:36:1:4 (i) and (ii) of Establishments Code are not accepted for the promotions)

*(Cross off the inapplicable words)

12.2 In case where the officer has not earned the salary increments during the 05 years immediately preceding the date on which he/she becomes eligible for promotion, the date of becoming eligible should be recalculated as at the date of earning the 05th salary increment. Accordingly, the date on which the officer becomes eligible**:…………………….

**(Certified copies of the salary increment forms should be attached after numbering them from 12.1 to 12.6)

13. Shall have not been subjected to any disciplinary punishment as per the provisions stipulated in Public Service Commission Circular 01/2020.

13.1 Has not been subjected to any disciplinary punishment during the 05 years immediately preceding the date on which the officer becomes eligible for promotion in accordance with the file. (The Head of the Department should certify this through a written declaration – Under Section “b” of the application)

13.2 Has been subjected to a disciplinary punishment during the period indicated in 13.1 and in case where particulars are mentioned under 11.2 and the date of promotion is revised accordingly, the relevant date: ……………………..

13.3 In case where the date of becoming eligible for promotion is revised in accordance with 12.2 and 13.2 , the newly revised date: ………………………..

14. Proof of good work and conduct in accordance with the annual performance evaluation of the immediately preceding years.

Particulars related to the performance evaluation of the years immediately preceding the year relevant to the date of becoming qualified as per 12 or 13 above should be indicated in the following table. The certified copies of the performance reports of all the years should be attached as indicated in the table. The reports in which more than one optional recommendation

is indicated at the end and the signature and official stamp of the relevant officer are not placed, shall not be accepted.

| Year | Final evaluation is excellent/ above the average/satisfactory/unsatisfactory | The relevant officers have/have not placed the signature |
|---|---|---|
| 2018 | | |
| 2019 | | |
| 2020 | | |
| 2021 | | |
| 2022 | | |
| 2023 | | |

Every row and column should be perfected in accordance with the performance report of each year.

15. Particulars of the qualifications as per 10.3.1 and Appendix (v) of the Minute of Sri Lanka Accountants' Service:

| 15.1 Serial Number | 15.2 Post Graduate Degree/other | 15.3 Field of study | 15.4 The university/ institution which offers the said degree/ qualification | 15.5 Whether that university has been recognized by the University Grants Commissions as a University | 15.6 Duration of the degree/ course. (Date of commencement and Date of ending) | 15.7 Effective date of the degree/course |
|---|---|---|---|---|---|---|
| 01 | | | | | | |
| 02 | | | | | | |
| 03 | | | | | | |
| 04 | | | | | | |
| 05 | | | | | | |

(Certified copies of the Postgraduate Degree/ course certificate and the detailed results (Transcript) sheet should be attached as 15.1)

16. Has / Has not completed an active period of service not less than eighteen (18) years as at the date on which the officer becomes eligible for promotion: ………………………………

17. Third Efficiency Bar Examination

17.1 Date on which the third efficiency bar examination should be passed:…………

17.2 Date on which the officer passed the third efficiency bar examination:………...

(A certified copy of the relevant certificate should be attached, numbering the same as No. 17.)

The application containing correct and all information from 01 to 17 above and certified copies of all the documents required to be attached, are hereby submitted as a file by numbering them consecutively and indicating the number relevant to the facts at the top right corner of each document.

Further, I hereby express my consent to be appointed to a post in Special Grade of Sri Lanka Accountants' Service at any place of work to which I have requested to be appointed on promotion, where a post in Special Grade of Sri Lanka Accountants' Service has fallen vacant / a place in close proximity to the said places.

I hereby express my consent to be reverted to my previous grade and post before promotion, if I am unable to accept the said post within one calendar month.

Date: .....................................

……………………………
Signature and designation of the applicant

**Part (B) – To be filled by the Head of the Department.**

Secretary,
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

1. All particulars mentioned above by the officer are correct.
2. Matters relevant to No. 11, 12 and 13 have been compared with particulars in the file. Accordingly, it is hereby certified that all the particulars mentioned are correct and they have been submitted in perfect manner and the **certified copies** of all the relevant documents are attached.
3. It is hereby certified that action is/ is not being taken to commence or **disciplinary action is/ is not being taken against the officer.**
   3.1 If the answer "is being taken", date of committing the offence: ………………………
   3.2 Number and date of the charge sheet issued by the Disciplinary Authority: …………

4. The work/ attendance/conduct of Mr/Mrs/Miss. …………………………………………… are satisfactory. His/ her performance, leadership, capability and ability to bear the posts and responsibilities relevant to the next promotion have been considered. It is hereby recommended / not recommended* to promote he/she to Special Grade of Sri Lanka Accountants' Service.

5. Application perfected correctly in each and every way and the file containing certified copies of relevant documents which have been numbered consecutively in accordance with each matter are sent herewith.

Date : ………………………………….                                 …………………………….

Signature, Designation and
Official Stamp of the Head of the
Department/Institution

Note: Cross off the inapplicable words.

**(Part (C) - To be filled by the Secretary of the respective Line Ministry/ Chief Secretary of the Province**

Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local

1. I agree/ do not agree with the recommendation made by the Head of Department/Institutions on the work and conduct of Mr. /Mrs. /Miss……………………., officer in Grade I of Sri Lanka Accountants' Service.

2. Work/ conduct/ special skills and performance of the officers have been evaluated.

   I recommend/ do not recommend* the promotion of Mr./Mrs./Miss. ………………………..to Special Grade of Sri Lanka Accountants' Service.*

   (*Indicate the reason in brief if the promotion is not recommended.)
   ……………………………………………………………………………………………
   ……………………………………………………………………………………………

3. Application perfected correctly in each and every way and the file containing certified copies of relevant documents which have been numbered consecutively in accordance with each matter are sent herewith.

……………………….                                    ……………………………….

Date                                    Signature of the Secretary of the Ministry/Chief Secretary of the Province

Official Stamp

Note: Cross off the inapplicable words.